මහව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 15 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 25 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මාර්ග තලනය බඳු දීම මගින් 2014 දෙසැම්බර් 31 දින සෘජුවම බැංකුවට ලැබී තිබුණු රු.350,000 ක මුදල ආදායම් ණයගැතියන් වශයෙන් ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණි.

(ආ) අංක PF - 4508 දරන රු.7,550,000 ක් වටිනා කැබ් රථය සහ රු.1,300,000 ක් වටිනා අංක RD - 8238 දරන ට්‍රැක්ටරය සහ ට්‍රේලරය මෝටර් රථ හා කරත්ත ගිණුමට ඇතුලත් කර නොතිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 04 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අතර රු20,003,455 ක නොසැසඳීම් පැවතුණි.

1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.1,092,000 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,208,661 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,165,912 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,374,573 ක පිරිහීමක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.98,159,141 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.90,750,925 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.6,199,555 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.63,566,000 න් දළ වශයෙන් 72% ක් වූ රු.45,618,000 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි ලැබීම්වලින් සමන්විත විය.එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.98,159,000 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල්වලින් සමන්විත විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.64,775,000 න් දළ වශයෙන් 63% ක් වූ රු.41,087,000 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර, ඉන් දළ වශයෙන් 55% ක් වූ රු.22,582,033 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර, එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.90,751,000 න් දළ වශයෙන් 4% ක් ලෙස රු.3,354,522 ක් පමණක් සභා අරමුදලින් වැය වී තිබූ අතර ඉතිරි 96% ක් වූ රු.87,396,478 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදනවලින් සිදු කල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.2,115,840 ක් වූ අතර 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32 සිට 42 දක්වා රීතීන් ප්‍රකාරව කාර්තු පදනම් කරගෙන හිඟ ලැයිස්තු සකස් කර, අදාල නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපල තහනමට ගෙන හිඟ වරිපනම් බදු අය කිරීමේ ක්‍රියාවලිය සිදු කර නොතිබුණි.

#### 2.3.2 සම්ප්‍රේෂණ කුළුනු ව්‍යාපාර බදු

සභා බල ප්‍රදේශයේ දුරකථන සම්ප්‍රේෂණ කුළුනු 27 ක් ස්ථානගත කර තිබූ අතර, එමගින් අවම වශයෙන් අයකරගත හැකි රු.81,000 ක බදු මුදල් අය කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

2.3.3 අනුකූලතා සහතික ආදායම්

සංවර්ධන බලපත්‍ර මත ඉදිකර තිබූ ඉදි කිරීම් සඳහා අනුකූලතා සහතික ලබා නොගැනීම හේතුවෙන් සභාවට රු.194,400 ක ආදායමක් අහිමි වී තිබුණි.

2.3.4 පාරිසරික බලපත්‍ර ආදායම්

සභා බල ප්‍රදේශයේ පරිසර බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර පවත්වාගෙන යාම හේතුවෙන් රු.59,500 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

2.3.5 ජල ආදායම්

සභා බල ප්‍රදේශයේ ජල පාරිභෝගිකයින් 241 ක ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.465,431 ක හිඟ ජල ගාස්තු අයවීමට තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ සිට බැකෝ යන්ත්‍රය මාර්ග සංවර්ධන අධිකාරියට ගිවිසුමකින් තොරව ලබා දී තිබුණු අතර, බැකෝ යන්ත්‍රය සඳහා ලැබුණු ආදායම 2013 වර්ෂයට සාපේක්ෂව රු.517,440 කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාන මාරු වී ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් රු.65,037 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු සුසාන භූමි 187 ක වටිනාකම් ගිණුම්ගත කර නොතිබූ අතර එයින් සුසාන භූමි 67 කට අදාල හිමිකම් ඔප්පු සභාව සතුව නොතිබුණි.

3.2 නිශ්ක්‍රීය වත්කම්

වසර ගණනාවකට පෙර අඹන්පොල කොන්ක්‍රීට් ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු කොන්ක්‍රීට් අච්චු 40 ක් ප්‍රයෝජනයට නොගෙන සභා භූමියේ රඳවාගෙන තිබුණි.

04 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පාලනය